# කෘෂිකර්ම සංගණනය 2002 පිළිබඳ කමිටු සාකච්ඡාව

දිනයः- 2002-03-08 වන දින පස්වරු 2.30 ට ප්‍රධාන කාර්යාලයේ දී

සහභාගිත්වය

1. ඒ පී ඩබ්ලිව් නානායක්කාර මහතා සංගණන අධිකාරි සහ ජන සං අ. ජනරාල්
2. බී ඩී පී එස් විද්‍යාරත්න මහත්මිය අධ්‍යක්ෂ
3. ආචාර්ය ගාමිණි ද සිල්වා මහතා අධ්‍යක්ෂ
4. එස් මදුරප්පෙරුම මහතා අධ්‍යක්ෂ
5. එස් සංගරපිල්ලේ මහතා ආරාධිත
5. ඒ එම් යූ දිසානායක මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ
7. ජේ දොඩම්ගොඩ මහතා ජේ. සංඛ්‍යාලේඛනඥ
8. ඩී ඩී එම් වී පෙරේරා මෙය ජේ. සංඛ්‍යාලේඛනඥ
9. සී ඩී ද සිල්වා මහත්මිය ජේ. සංඛ්‍යාලේඛනඥ

සංගණන අධිකාරි හා සාංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව ආරම්භ විය.

02. මේදින පැවැති රැස්වීමේදී වතු උපලේඛනය සාකච්ඡා කිරීමට ප්‍රදාන තේමාව වූ අතර රට ප්‍රථමයෙන් කිහිපයක්ම සාකච්ඡාවට භාජනය කොට පහත තීරණයන්ට එළඹිණ.

සංගණනය පිළිබඳව විදුහල්පතිවරු මගින් පාසල් ළමුන් දැනුවත්කොට මවුන්ගේ දෙමව්පියන්ගේ සහයෝගය ගණන්ගන්නා නිලධාරියා වෙත ලබා දීම සඳහා සකස් කරන ලද ලිපියක සහ එම ලිපියේ සඳහන් පතිවුඩය පාසැලේ සතියේ ආරම්භක රැස්වීමේ දී ගුරු ශිෂ්‍ය දෙපිරිසටම ප්‍රකාශකරන ලෙස දන්වා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් ගෙන් විදුහල්පතිවරුන් වෙත යැවෙන ලිපියක ද කෙටුම් පත් ඉදිරිපත් කරන ලදුව අනුමත කෙරිණ.මෙම ලිපියේ රාජ්‍ය ලාංඡනය සහ සංගණන අධිකාරිගේ නම ද යෙදීමට තීරණය විය.

ප්‍රචාරක කටයුතු සඳහා මුද්‍රණය කරන දැන්වීම සඳහා චිත්‍ර දෙකක් ඉදිරිපත් කරන ලද අතර එය සෞන්දර්යායතනයේ ප්‍රවීනයන් ගෙන් විමසා මවුන්ගේ නිර්දේශ ලබා ගැනීමට තීරණය විය.

දැනට මුද්‍රණය සඳහා මුද්‍රණ සංස්ථාව වෙත දී ඇති ආකෘතීන් සඳහා එම සංස්ථාවට අත්තිකාරම් මුදලක් ලෙස ඉල්ලා ඇති මුදල ගෙවීමට සංගණන අධිකාරි අනුමැතිය ලැබිණ.

දැනට මුද්‍රණය කිරීම සඳහා දී ඇති ආකෘති සියල්ලම දෙමල භාෂාවට පරිවර්තනය සඳහා දැනටමත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ පරිවර්තක වෙත යවා ඇති අතර එම ආකෘති ද අවශ්‍ය ප්‍රමාණයන් මුද්‍රණය කිරීමට තීරණය විය.

කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන නිලධාරීන්ගේ වගකීම් සහ කාර්යභාරය පිළිබඳව වූ උපදෙස් සංග්‍රහයක් ද ඉදිරිපත් කරන ලදුව සාකච්ඡා කොට එය මුද්‍රණය සඳහා යෝග්‍ය බවට තීරණය විය.

අනතුරුව සාකච්ඡා කළේ වතු උපලේඛනයයි. දැනටමත් සංශෝධිත වතු නාමලේඛනයන් දිස්ත්‍රික් දෙකකින් ලැබී ඇති බව ප්‍රකාශ විය.

පහත සංශෝධනයන් කිරීමට එකඟ විය.

කාරකයාගේ වෘත්තීය සුදුසුකම් ලබා තිබේද යන ප්‍රශ්නයට පිළිතුර ඔව් නම් පුහුණුව ලැබූ කාල සීමාව පිළිබඳව විමසීම සඳහා වූ අතුරු ප්‍රශ්නයක් ඇතුළත් කිරීමට තීරණය විය.
2.6 හි ඇති රෝම අංකනයන් ඉවත් කිරීම
3 හි බිම් ප්‍රමාණය සටහන් කරන ඒකකය පිළිබඳව විමසා එයට පිළිතුර ලියා දැක්වීම සඳහා හිස් කොටුවක් යෙදීම 4 වන කොටසේ සහ එළඹෙන සෑම ප්‍රශ්නයකම බිම් ප්‍රමානය දක්වන අවස්ථාවල දී පිළිතුරු සපයන ඒකකය අකුරින් ලිවීම සඳහා හිස් කොටුවක් ඇතුළත් කිරීමටද තීරණය විය.
තවද 4 වන කොටසේ 8 සිට 14 දක්වා තීරුවල බිම් ප්‍රමාණය පිළිබඳව විමසන බැවින් එම තීරු සියල්ලටම පොදු වනසේ බිම් ප්‍රමාණය යනුවෙන් යෙදීම යෝග්‍ය බව තීරණය විය.

5.1 තේ 5.2 රබර් 5.3 පොල් යන ප්‍රශ්න සියල්ලටම ඉහත දැක්වූ පරිදි උඩින් ම පිළිතුර සපයන ඒකකය ලිවීමට සහ අක්කර/හෙක්ටයාර ලෙස දක්වා ඇති තීරු බිම් ප්‍රමානය ලෙස නම් කිරීමටත් තීරණය වියු. එම ප්‍රශ්න සියල්ලේම ඉංග්‍රිසි පරිවර්තනයන්ද නිවැරදි කිරීමට තීරණය විය. මෙසේ පරිවර්තනයන් සංශෝධනය කිරීමේ දී සැකමුසු සෑම අවස්ථාවක දීම අදාල ආයතන සහ නිලධාරීන්ගෙන් විමසීමට තීරණය විය.

5.4 හි වෙනත් ස්ථිර භෝග යටතේ අක්කර හෝ හෙක්ටයාර ගණන සැපයීමට ඉඩ කඩ සැලසීම සහ කුඩා ප්‍රමාණයන් දැක්වීමට ගස් වැල් හෝ පඳුරු ගණන දැක්වීමට ඉඩකඩ සැලසීමට තීරණය විය.

5.5 හි කාලීන භෝග යටතේ 6 සිට 11 දක්වා තීරු වලට උඩින් ඇති හිස් කොටු වල භෝගයේ නම සඳහන් කොට ර්ට යටින් පාට කොට ඇති තීරුවේ බිම් ප්‍රමාණය යනුවෙන් යෙදීමටත් තීරණය විය.

6 වන කොටසේ 9 වන තීරුවේ 'ලොරි' 3 වන තීරුවේ සටහන් කොට ඉතිරි තීරු අංකනයනක් ඒ අනුව සංශෝධනය කිරීමටත් මෙහි සපයා ඇති හිස් තීරු වෙනුවට වෙනත් වැදගත් යන්ත්‍රෝපකරණ දැක්වීමට හැකියාව වැඩිදුර විමසීමටත් තීරණය විය. පරිවර්තන වැකි ද යලි සලකා බැලීමට දන්විය.

7 වන කොටස පොහොර භාවිතය 7 සිට 10 දක්වා තීරුවලට උඩින් ඇති හිස් කොටු වල භෝගයේ නම යන්න මුද්‍රණය කිරීමට තීරණය විය. පොහොර වල වෙළඳ නාමය හෝ ඒ ඒ භෝගය අනුව තොරතුරු ලබා ගැනීමේ දී ඇති වන සීමිතතාවයන් ගැනද දීර්ඝව කරුණු දැක්විණ.

9 වන කොටසේ 9.1 හි නේවාසික ජන සංඛයාව යනුවෙන් යෙදීම සහ 9.2 හි ශ්‍රේණිය වෙනුවට (Occupational Category) රැකියාවේ ස්වභාවය විමසීමත් අවුරුදු 15 ට වැඩි යන්න අවුරුදු 15 හා ර්ට වැඩි යනුවෙනුත් වෙනස් කිරීමට තීරණය විය.

සංගණනයේ මූලික සාරාංශ වාර්තා ලබා ගැණිමට අදාලව පද්ධති විශ්ලේශක මිගාර ප්‍රනාන්දු මයා මී ලග රැස්වීමට කැඳවීමටත් එම රැස්වීම මාර්තු 18 වන සඳුදා දිනයට යොදාගැනීමටත් තීරණය විය.

පස්වරු 4. 45 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය .

ජේ. දොඩම්ගොඩ
සංඛ්‍යාලෙඛනඥ